සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 57 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

## නාට්‍ය හා රංගකලාව I
### පෙරදිග නාට්‍ය කලාව

කාලය පැය තුනයි

- **I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**
- **II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. නෘත්ත, නෘත්‍ය නාට්‍ය වශයෙන් දැක්වෙන අර්ථ නිරූපණය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි පිළිතුර තෝරන්න.
    1. භරතමුණි මේ පිළිබඳව කිසිවක් සඳහන් නොකරයි.
    2. නාට්‍යය, නෘත්ත හා නෘත්‍ය තරම් ප්‍රභල නැත.
    3. නෘත්‍යයෙන් කිසිඳු භාවයක් ප්‍රකට නොකෙරේ.
    4. නෘත්ත යනු ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍ර වික්ෂේපයක් පමණි.
    5. නාට්‍යයට නෘත්ත හා නෘත්‍යයේ සහය අවශ්‍ය නැත. (.....)

02. නෘත්තයට අදාළ නොවන වරණය තෝරන්න.
    1. රංග භූමිය.
    2. සාත්ත්වික අභිනයය.
    3. වාද්‍ය වෘන්දයය.
    4. වේෂ භූෂණ.
    5. අංග චලනය. (.....)

03. වාචික අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. ජනාන්තික, අපවාරිත හා ප්‍රකාශ භාෂණ ආදී භාෂණ විධි වාචිකාභිනයට අයත් නොවේ.
    2. ලෝක ධර්මී සම්ප්‍රදායේ වාචිකාභිනයට වැදගත් තැනක් හිමි නොවේ.
    3. වාචික අභිනයෙන් තොර ප්‍රාසංගික කලාවක් පැවතිය නොහැකිය.
    4. වාචික අභිනයට අයත් වන්නේ සංවාද පමණි.
    5. නාට්‍ය ධර්මී සම්ප්‍රදායේ දර්ශන, පසුතල ආදිය මවා පාන්නේ වාචික අභිනයෙනි. (.....)

04. නාට්‍ය දර්ශනයක් සාර්ථක වීමට,
    1. නළු - නිළියන් සිය සංවාද වණ පොත් කොට තිබීම අවශ්‍යය ය.
    2. සියලුම නළු නිළියන් ගායනය හා වාදනය ප්‍රගුණ කොට තිබිය යුතුය.
    3. අනුෂංගික අංග උපරිම වශයෙන් භාවිත කළ යුතුය.
    4. නළු - නිළියන් හා රංග භූමියක් තිබීම ප්‍රමාණවත්ය.
    5. රංග කාලය අසීමිතය. (.....)

05. ප්‍රසංගික කලා යන්නෙන් අදහස් කරන්නේ,
   1. ශ්‍රව්‍ය දෘශ්‍ය කලා සියල්ල ගම්‍ය වේ.
   2. විවිධ ප්‍රසංග මඟින් ඉදිරිපත් කරන කලාංග යන අදහස ගම්‍ය වේ.
   3. රංගනයෙන් ගායනයෙන් හා කථනයෙන් පමණක් ඉදිරිපත් කෙරේ.
   4. සියලුම ලලිත කලා අදහස් කෙරේ.
   5. ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරයි. (.....)

06. නාට්‍ය කලාව හා සෙසු ප්‍රාසාංගික කලා පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
   1. වේදිකාවක් මත ඉදිරිපත් කරන කලාවන්ය.
   2. අනුෂංගික අංග අඩුවැඩි වශයෙන් යොදා ගනී.
   3. තනිව කියවා රස විඳිය හැක.
   4. බැලේ සහ මුද්‍රා නාට්‍ය සඳහා සංගීතය බහුලව යොදා ගනී.
   5. ප්‍රේක්ෂක පිරිසක් අත්‍යවශ්‍ය වේ. (.....)

- **පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණද එක් එක් ප්‍රකාශය ඉදිරියේ ඇති වරහන තුල ලකුණු කරන්න.**

07. ඔපෙරා යනු 16 වන ශත වර්ෂයේ දී ඉතාලියේ බිහි වූ නාට්‍ය විශේෂයකි. (.....)

08. නාට්‍යය, ප්‍රසාංගික කලා අතර වඩාත් පුළුල් වූ නිරූපණ කලාවකි. (.....)

09. බැලේ නාට්‍යයක දී වාචික අභිනය භාවිතා කෙරේ. (.....)

10. කලාව නිර්මාණාත්මකය, එහෙත් ශිල්පය පුරුදු පුහුණු කළ යුතු අංශයකි. (.....)

11. ඇදහිලි, විශ්වාස, සිරිත් විරිත් හා පූජා කර්ම පදනම් කරගෙන බිහිවූ කලා ගැමි කලා වේ. (.....)

- **හිස්තැන් පුරවා පහත දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.**

12. නාට්‍යයක් රඟ දැක්වීම සඳහා අත්‍යවශ්‍ය දෙපාර්ශවය නම් ............................................ හා ............................................ ය.

13. නාට්‍යයක් නරඹන විට ප්‍රේක්ෂකයා ඉදිරියේ මොහොතින් මොහොත වෙනස් වෙමින් මැවෙන දර්ශනය ............................................ නම් වේ.

14. ............................................ යනු නාට්‍යයක නිරූපණ අවශ්‍යතාවයට අනුකූලව රංගය රිද්මයානුකූලව හා තාලානුකූලව පෙළ ගැස්වීමයි.

15. ''නාට්‍යය ජීවිතයේ පිටපතකි. සිරිත් විරිත්වල කැඩපතකි'' යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ ............................................ ය.

16. ගැටුම නාට්‍යයක මූලික අවශ්‍යතාවයි. ''ගැටුමක් නැති තැන නාට්‍යයක් නොමැත'' මේ අදහස ප්‍රකාශ කරනු ලැබුයේ ............................................ විසිනි. (.....)

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

17. ''අභිනය'' සංකල්පය බිහි වූයේ,
   1. භාරතයේ ය. 2. ඇමරිකාවේ ය. 3. එංගලන්තයේ ය.
   4. ග්‍රීසියේ ය. 5. ජපානයේ ය. (.....)

18. නාට්‍යයට සම්බන්ධවන සියළුම දෙනා මෙහෙයවමින් නාට්‍ය දර්ශනය ආරම්භ කිරීමත් පවත්වාගෙන යාමත් සිදු කරනු ලබන්නේ,
1. වේදිකා පරිපාලක 2. රචකයා 3. නිෂ්පාදක 4. පෙළ කියවන්නා 5. අධ්‍යක්‍ෂ (.....)

19. නළු නිළියන්ගේ රැවුල් හා කොණ්ඩා මෝස්තර සැකසීම අයත් වන්නේ,
1. අංග රචනාවලටය. 2. වේෂ භූෂණ වලටය. 3. ප්‍රස්ත වලටය.
4. නාට්‍යෝපකරණ වලටය. 5. රංග භාණ්ඩ වලටය. (.....)

20. නාට්‍ය රස අටට අයත් නොවන රසය වන්නේ,
1. රෞද්‍ර රසය 2. බීභත්ස්‍ය රසය 3. අද්භූත රසය
4. ශාන්ත රසය 5. වීර රසය (.....)

21. නාට්‍ය ධර්මී ලක්‍ෂණ ප්‍රබලව ඇති නාට්‍ය ගොනුව වන්නේ,
1. කඳා වළලු, බහින කලාව, දික්තල කාලගෝල. 2. සිංහබාහු, ස්වර්ණතිලකා, කාමරේ පොරේ.
3. සිංහබාහු, තලමල පිපිලා, වෙරිවත්ත. 4. දික්තල කාලගෝල, මනමේ, සිංහබාහු
5. මරාසාද්, භව කඩතුරාව, දැවැද්දෝ (.....)

22. ලෝක ධර්මී ලක්‍ෂණ ප්‍රබලව ඇති නාට්‍ය ගොනුව කුමක් ද ?
1. හුණුවටය, අහස් මාලිගා, තට්ටු ගෙවල්
2. ජනේලය, අහසින් වැටුණු මිනිස්සු, දික්තල කාලගෝල
3. අපට පුතේ මගක් නැතේ, මන රංජන වැඩ වර්ජන, මනමේ
4. නරි බෑණා, කැළණි පාලම, කාමරේ පොරේ
5. කැළණි පාලම, වහලක් නැති ගෙයක්, මෝදර මෝල (.....)

23. නාට්‍ය ධර්මී නාට්‍යවලට අයත් ගීත ඛණ්ඩ වනුයේ,
1. දුලා නෙතුපුලා, ඇසට නැතේ, රතදර සිරියා පරදන
2. යස ඉසුරු, විහාගේ විහාගේ, අපි ගමට යමු
3. දී කිරි දී කිරි, බෝ දොස්කියා, ශෝබාව දේ
4. ගල්ලෙන බිඳලා, මඬේ ලගින තාරාවුන්, අන්න බලන් සඳ
5. ප්‍රේමයෙන් මන රංජිත වේ, සුවඳ සබන් ඇඟ ගාලා, එක දෙක කර කියනා ලෝකේ (.....)

24. ටෙලි නාට්‍යයට අදාළ වරණය තෝරන්න.
1. අධ්‍යක්‍ෂවරයෙක් අවශ්‍ය නැත. 2. ශ්‍රව්‍ය - දෘශ්‍ය කලාවක් නොවේ.
3. ප්‍රේක්‍ෂකයන් හා සජීවී ලෙස සම්බන්ධ වේ. 4. සංස්කරණයට වැදගත් තැනක් හිමිවෙයි.
5. කොටස් වශයෙන් ප්‍රදර්ශනය කළ නොහැකිය. (.....)

25. වේදිකා නාට්‍යයක සංගීතය අයත්වන අභිනය කුමක් ද ?
1. ආංගික අභිනය 2. වාචික අභිනය 3. ආහාර්ය අභිනය
4. සාත්වික අභිනය 5. සර්වාභිනය (.....)

26. වේදිකා නාට්‍යයට අදාළ නොවන වරණය තෝරන්න.
1. ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවකි. 2. ප්‍රාසාංගික කලාවට අයත්
3. සජීවී බවින් යුක්තය. 4. පටිගත කොට සංස්කරණයට ලක් කරයි.
5. ප්‍රේක්‍ෂක ප්‍රතිචාර මත වෙනස් කළ හැකිය. (.....)

27. නාට්‍ය පෙළ රචනය සඳහා පදනම් නොවන අංගය මින් කුමක් ද ?
1. තේමාව 2. ගැටුම 3. රංග විධාන 4. උත්ප්‍රාසය 5. රංග වින්‍යාසය (.....)

28. පසුතල නිර්මාණ සැකසීමේදී අදාල නොවන ප්‍රකාශය තෝරන්න.
1. ප්‍රවාහන පහසුව. 2. විචිත්‍රවත් වීම. 3. ඉක්මණින් සවිකිරීමේ හා ගැලවීමේ හැකියාව.
4. බහු කාර්යය සඳහා යොදාගත හැකි වීම. 5. නිර්මාණාත්මක වීම. (.....)

29. වේෂ භූෂණ සකස් කිරීමේදී අවධානය යොමු නොකරන කරුණ කුමක් ද?
1. තේමාව 2. ශෛලිය 3. කාලය හා යුගය
4. චිත්තාකර්ශනීය බව 5. සංස්කෘතික පසුබිම (....)

30. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා රචනා නොකරන ලද නාට්‍ය තෝරන්න.
1. දික්තල කාලගෝල 2. මනමේ 3. රත්තරං
4. එලොව ගිහින් මොලොව ආවා 5. සිංහබාහු (.....)

- **ප්‍රශ්න අංක 31 සිට 37 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නාම පහ බැගින් දී ඇත. ඒ අතර සෙසු පද හා නොගැලපෙන පදයක් ඇත. එය තෝරා වරහන තුළ ලියන්න.**

31. 1. රෝම සෑපුවීම. 2. කටහඬ බිඳීම. 3. සඳ බැසයාම.
4. ශරීරය දරදඬු වීම. 5. දහදිය දැමීම. (.....)

32. 1. රංග පීඨය 2. රඟ මඩල 3. කරළිය 4. වේදිකාව 5. තානායම්පොළ (.....)

33. 1. රංග භූමිය 2. දියෝනීසස් රඟහල 3. ආරුක්කු වේදිකාව
4. ග්ලෝබ් රඟහල 5. සංදර්ශන රථ (.....)

34. 1. ඉහළ දකුණ 2. මැද මැද 3. පහළ වම
4. වම දකුණ 5. මැද වම (.....)

35. 1. චිත්‍ර 2. මූර්ති 3. කැටයම්
4. පද්‍ය නිර්මාණ 5. මුද්‍රා නාට්‍ය (.....)

36. 1. වස්ත්‍රාභරණ 2. රංගා ලෝකය 3. අංග රචනය
4. නාට්‍යෝපකරණ 5. ප්‍රේක්ෂකයා (.....)

37. 1. විදුලි පහන් 2. යොමු පහන් 3. ධාරා පහන්
4. තීරු ලාම්පු 5. වර්ණ චක්‍රය (.....)

38. නිර්මිත කලාවක් වන්නේ මින් කුමක් ද ?
1. වඩු කුරුළු කූඩුව 2. මොනාලිසා චිත්‍රය 3. සඳ බැසයන රාත්‍රිය
4. මුහුදු වෙරළේ සුළඟ 5. මල් ගොමුවේ කුරුළු නද (.....)

39. ලලිත කලාවට අයත් නොවන නිර්ණායකයක් වන්නේ,
1. මටසිලුටු බවින් යුක්ත වීම.
2. මනස හා පරිකල්පනය සමඟ සම්බන්ධ වීම.
3. පාඨකයාගේ, ප්‍රේක්ෂකයාගේ හෝ ශ්‍රාවකයාගේ විඥානය පුළුල් කිරීම.
4. ප්‍රාග් ඓතිහාසික කලාව ලෙසද හැඳින්වීම.
5. සංගීතය, නර්තනය ආදිය මීට අයත් වීම. (.....)

40. දී ඇති ගීත ඛණ්ඩයට අදාලව වැරදි නාට්‍ය ලියා ඇති වරණය තෝරන්න.
1. දී කිරි දී කිරි - රතු හැට්ටකාරී
2. යුධ භටය යන යුධයට - හුණුවටයේ කතාව
3. අපි ගමට යමු - දික්තල කාලගෝල
4. වාසනා දිනේති නේක - ශ්‍රී වික්‍රම නූර්තියේ
5. හනික වරෙව් කොල්ලනේ - අමර ගියා දිව්‍යලෝකේ (.....)

## නාට්‍ය හා රංගකලාව

### පළමු වාර පරීක්ෂණය

### 12 ශ්‍රේණිය - I පත්‍රය

### II කොටස

---

- **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A - කොටස

01. (i) නෘත්ත, නෘත්‍ය යනු කවරේදැයි කෙටියෙන් ලියා දක්වන්න. (ල. 4)
   (ii) නාට්‍ය හැර සෙසු ප්‍රාසාංගික කලා විෂයෙහි නෘත්ත නෘත්‍යයෙහි උපයෝගීතාවය පහදන්න. (ල. 5)
   (iii) ඔබ සඳහන් කළ සෙසු ප්‍රාසාංගික කලා ඉක්මවා යාමට නාට්‍යයට ඇති විශේෂ හැකියාව පැහැදිලි කරන්න. (ල. 6)

02. (i) නාට්‍ය කලාව පිළිබඳ පෙරදිග නිර්වචන 02ක් ඒවා ඉදිරිපත් කළ විද්වතුන්ගේ නම් සමඟ ලියා දක්වන්න. (ල. 4)
   (ii) නාට්‍ය කලාවේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 5ක් ලියා දක්වන්න. (ල. 5)
   (iii) ''නාට්‍ය වනාහි අනෙකුත් කලාවන්ගෙන් පෝෂණය වන පරායත්ත කලාවකි'' විමසන්න. (ල. 6)

03. (i) නාට්‍ය ධර්මී, ලෝක ධර්මී සංකල්පය බිහිවූයේ කවර රටකද, එය ඉදිරිපත් කළ විචාරකයා කවු ද ? (ල. 4)
   (ii) ලෝක ධර්මී නාට්‍ය යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 5)
   (iii) ඕනෑම නාට්‍යයක් ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී සම්ප්‍රදායන්ගේ සංකලනයකි. ඔබේ අදහස් දක්වන්න. (ල. 6)

### B - කොටස

04. (i) සතර අභිනය යන්න හඳුන්වා දෙන්න. (ල. 4)
   (ii) අභිනය අයත් වන්නේ නාට්‍ය පිටපතටද, නැතිනම් රූපණයටද පිළිතුර සහේතුකව විග්‍රහ කරන්න. (ල. 5)
   (iii) ආහාර්ය අභිනයට අයත් අංග පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ල. 6)

05. (i) නාට්‍ය හා රංගකලාවට අයත් මූලිකාංග 04ක් නම් කරන්න. (ල. 4)
   (ii) ඉන් මූලිකාංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)
   (iii) නාට්‍ය අධ්‍යක්ෂණයේ දී එකී අංගවල දායකත්වය කෙසේ ලබාගත යුත්තේදැයි විස්තර කරන්න. (ල. 6)

06. (i) රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 4)
   (ii) රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස තුන බැගින් නම් කරන්න. (ල. 5)
   (iii) රංග ක්‍රීඩා සහ රංග අභ්‍යාස තුළින් නළුවාට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 6)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 | S | II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## නාට්‍ය හා රංගකලාව II
අපරදිග නාට්‍ය කලාව

කාලය පැය තුනයි

- **I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**
- **II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එම අංකය වරහන තුළ යොදන්න.**

01. ගැමි කලාවට අයත් වැරදි පිළිතුර තෝරන්න.
    1. ජන සමාජවල බිහි වී වර්ධනය වී ඇත.
    2. ප්‍රාකෘතික කලාවට වඩා යම් පමණකින් ආත්මීය සම්බන්ධතාවයක් ඇති කිරීමට සමත්ය.
    3. සොකරි, කෝලම් ආදී ගැමි නාටක මීට අයත්ය.
    4. මිනිසාගේ විඥානය පුළුල් කිරීමෙහි ශක්තියක් ඇත.
    5. ජන කවි, ජන සංගීතය ද මෙහි අංග වෙයි. (.....)

02. අනුකරණය පිළිබඳව ඇරිස්ටෝටල්ගේ මතවාදයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
    1. කවියකු සතු අනුකරණ මාධ්‍ය විධි 5ක් ඇත.
    2. ශෝකෝත්පාදකය යනු උතුම් ක්‍රියාවක අනුකරණයකි.
    3. ශෝකෝත්පාදකයේදී ප්‍රකෘති තත්වයට වඩා පහත් මිනිසුන් අනුකරණය කෙරේ.
    4. ප්‍රකෘති තත්වයට වඩා උසස් මිනිසුන් අනුකරණය කෙරෙනුයේ හාස්‍යෝත්පාදකයේදීය.
    5. අනුකරණ මාධ්‍ය විධි පිළිබඳව කිසිදු සඳහනක් කාව්‍ය ශාස්ත්‍රයේ සඳහන් නොවේ. (.....)

03. ග්‍රීක නාට්‍යකරුවෙකු නොවන්නේ මින් කවරෙක් ද ?
    1. තෙස්පීස් 2. ප්‍රටිනස් 3. ෆ්‍රිනිබොස් 4. ඉකරියොස් 5. බොයිරිලොස් (.....)

04. ක්‍රි.පූ. 534 දී ප්‍රථමවරට සිතිරැම්බොස් ගායක වෘන්දයට එක්වූ නළුවා වන්නේ,
    1. පෙරියන්ඩර්ය. 2. අරියොන්ය. 3. තෙස්පීස්ය. 4. සෝලෝන්ය. 5. මෙනන්ඩ්‍රොස්ය.(.....)

05. ග්‍රීක වේදිකාවට දෙවැනි නළුවකු හඳුන්වාදෙනු ලැබුයේ,
    1. ඊස්කිලස්ය. 2. තෙස්පීස්ය. 3. යුරිපිඩීස්ය.
    4. සොෆොක්ලීස්ය. 5. ඇරිස්ටොෆානීස්ය. (.....)

06. දැනට සම්පූර්ණයෙන්ම ඉතිරිව ඇති සැටර් නාට්‍ය වන්නේ,
    1. ඇල්කිස්ටිස්ය 2. ඉක්නෙව්ටා ඉ ය 3. කුක්ලොප්ස්ය
    4. බක්ඛයිය 5. දෙබරුය (.....)

07. සමකාලීන මාතෘකාවක් අලලා ඊස්කිලස් විසින් රචිත ශෝකෝත්පාදකය වන්නේ,
    1. අයියස්ය. 2. පාරසිකයෝය. 3. මීඩියාය.
    4. ඉයෝන්ය. 5. ප්‍රොමිතියස් බන්ධනයය. (.....)

08. යථාර්ථයේ පියා ලෙස විචාරකයන් හඳුන්වන ග්‍රීක නාට්‍යකරුවා කවුරුන් ද ?
1. ඊස්කිලස්ය. 2. ඇරිස්ටොෆනීස්ය. 3. මෙනැන්ඩ්‍රොස්ය.
4. සොෆොක්ලීස්ය. 5. යුරිපිඩීස්ය. (.....)

09. ග්‍රීක කොමඩි නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. එහි වේෂ භූෂණ ග්‍රීක ශෝකෝත්පාදකය හා සමානය.
2. කොමඩියේ පරමාර්ථය වූයේ උත්තුංග ක්‍රියා අනුකරණයයි.
3. කාව්‍ය ශාස්ත්‍රයේ වැඩි අවධානයක් යොමුකොට ඇත්තේ සුඛෝත්පාදකයටය.
4. මෙහි ගායක වෘන්දය 24 දෙනෙකුගෙන් සමන්විතය.
5. කොමඩි නාට්‍යවලදී නළුවන් වෙස් මුහුණු නොපලදී. (.....)

10. ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. මෙනැන්ඩ්‍රොස් අවසාන ග්‍රීක ට්‍රැජඩි නාට්‍යකරුවාය.
2. මෙහි ගායක වෘන්දය 24 දෙනෙකුගෙන් සමන්විතය.
3. දැනට ඉතිරිව ඇති සාක්ෂි අනුව ස්වර්ණමය යුගයේ ශ්‍රේෂ්ඨම නාට්‍යකරුවා සොෆොක්ලීස්ය.
4. ලයිසිස්ට්‍රාටා සහ වලාකුළු ඊස්කිලස්ගේ හොඳම නාට්‍ය දෙකය.
5. නාට්‍ය උත්සවයකදී ට්‍රැජඩි නාට්‍ය 5ක් සමඟ එක් සැටර් නාට්‍යයක් ඉදිරිපත් කළයුතු වීය. (.....)

- **ප්‍රශ්න අංක 11 සිට 18 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා සංකල්ප/නාම පහ බැගින් දී ඇත. ඒ අතර සෙසු පද හා නොගැලපෙන පදයක් වෙයි. එම පදය තෝරා එහි අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.**

11. 1. සෝලෝන් 2. සියුස් 3. දියෝනිසස් 4. ඇපලෝ 5. ඇතීනා (.....)
12. 1. කොතුර්නෝස් 2. මේකීස් 3. ක්ලීමේකීස් 4. ඕර්කිස්ට්‍රාව 5. පැරස්කිනියා (.....)
13. 1. වළාකුළු 2. මණ්ඩුකයෝ 3. කුරුල්ලෝ 4. ලයිසිස්ට්‍රාටා 5. හිපොලිටස් (.....)
14. 1. විධානය 2. තර්ජනය 3. ආයාචනය 4. පිළිතුරු ඇසීම 5. ප්‍රේක්ෂාව (.....)
15. 1. කොරෙගුස් 2. ඩිතුරම්බොස් 3. ප්ලැටියා 4. කැතාර්සීස් 5. හියුබ්‍රිස් (.....)
16. 1. දෙවැනි එඩ්වර්ඩ්ගේ කතාව 2. සකලජන 3. මැන්කයින්ඩ්
4. මිලිටොස් ලුණ්ඨනය 5. අන්තිම රාත්‍රී භෝජනය (.....)
17. 1. චෙස්ටර් 2. ස්වෝන් 3. වේක්ෆීල්ඩ් 4. යෝක් 5. කවන්ට්‍රි (.....)
18. 1. ශ්‍රේණි නාටක 2. උමං දොරටු 3. මේන්ෂන් 4. එපිඩෝරන්ස් 5. ටර්ටූලියන් (.....)

19. කාව්‍ය ශාස්ත්‍රය සම්බන්ධ වැරදි ප්‍රකාශය කුමක් ද ?
1. මෙය ඇරිස්ටෝටල් තම ශිෂ්‍යයන් සඳහා පැවැත්වූ දේශන එක් කොට කෘතියක් ලෙස සම්පාදනය කරන ලද්දකි.
2. මෙහි ට්‍රැජඩි, කොමඩි, සැටර් හා වීර කාව්‍ය ලෙස කාව්‍ය වර්ග 4ක් පිළිබඳව සඳහන්ය.
3. කාව්‍ය ශාස්ත්‍රයෙහි වැඩි අවධානයක් යොමුකොට ඇත්තේ ශෝකාත්ම නාට්‍ය ප්‍රභේදය කෙරෙහිය.
4. මෙම ග්‍රන්ථය රචනා කරන ලද්දේ ක්‍රි.පූ. 6වන සියවසෙහිය.
5. ක්‍රියා ඒකත්වය සහ කාල ඒකත්වය පිළිබඳව මෙහි සඳහන්ය. (.....)

20. සැටර් නාට්‍ය සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. දැනට සම්පූර්ණයෙන්ම ඉතිරිව ඇත්තේ යුරිපිඩීස්ගේ කුක්ලොප්ස් නම් නාට්‍යයයි.
2. හාස්‍යජනක ග්‍රීක පුරාණෝක්ති මෙම ප්‍රභේදයේ නාට්‍යයන්ට වස්තු විෂයය වීය.
3. ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය කලාව පිරිහුණද සැටර් නාට්‍ය කලාව තවත් ශත වර්ෂ දෙකක් පමණ නොපිරිහී පැවතුණි.
4. ඉක්නෙව්ටායි සොෆොක්ලිස් විසින් ලියන ලද සැටර් නාට්‍යයකි.
5. තරඟවලට ඉදිරිපත් වූ සෑම ශෝකාත්ම නාට්‍ය රචකයකුම ශෝකාත්ම නාට්‍ය තුනක් සමඟ සැටර් නාට්‍යයක් ද ඉදිරිපත් කළ යුතු වීය. (.....)

21. ඊඩිපස් රජ නාට්‍යයේ සැබෑ දෙමාපියන් රජ කරනු ලැබුයේ,
1. කොරින්තයේය. 2. සිතරෝනයේය. 3. තීබසයේය.
4. ඇතන්සයේය. 5. ආගෝසයේය. (.....)

22. ''දැන් ඒ ගැන සොයා ඇති ඵලය කුමක් ද ? ඒ ගැන සොයන්නේ කුමකට ද ?'' මෙම සංවාදය ප්‍රකාශ කරනුයේ,
1. ජොකස්ටා විසින් ඊඩිපස්ටය. 2. ඊඩිපස් විසින් ක්‍රයෝන්ටය.
3. ක්‍රයෝන් විසින් ඊඩිපස්ටය. 4. ඊඩිපස් විසින් පණිවිඩකරුටය.
5. තෛරේසියස් විසින් ඊඩිපස්ටය. (.....)

23. ක්‍රි.ව. 311 දී රෝම නාට්‍ය තහනම් කරන ලද්දේ කවුරුන් විසින් ද ?
   1. ශාන්ත නිකුලස්තුමා විසින්.
   2. ටර්ටූලියන් පියතුමා විසින්.
   3. අර්බන් පාප්වරයා විසින්.
   4. කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යා විසින්.
   5. IV වන හෙන්රි රජු විසින්. (.....)

24. මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය කලාවට අදාල නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. මධ්‍යකාලීන යුරෝපයේ සියලු නාට්‍ය පල්ලිය තුළ පමණක් රඟ දැක්විණි.
   2. නළු - නිළියන් ලෙස සහභාගීවූයේ පූජකවරුන් පමණකි.
   3. ''ද මිස්ටරි ඔෆ් ඇඩම්'' පැරණිතම අත්භූත නාටකය ලෙස සැලකේ.
   4. කිසිදු මධ්‍යකාලීන නාට්‍යයක් අනුවර්තනයක් හෝ පරිවර්තනයක් ලෙසින් සිංහල බසට නැඟී නැත.
   5. ඉංග්‍රීසි චක්‍ර නාටක සඳහා බයිබල් කතා පුවත් පදනම් වූයේ නැත. (.....)

- **පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක 25-28 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | ගෙත්සමනී උයන | B | අතිමානය | C | දුර්භික්ෂය | D | මණ්ඩූකයෝ |
| E | මෙරෝපේ | F | එව්පොලිස් | G | ජුදාස් | H | කැතාර්සීස් |
| I | උත්ථානය | J | එක්කුක්ලීමාව | K | කොරින්තය | L | වළාකුළු |

25. ඊඩිපස් රජ නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
   1. A G K ය. 2. E H L ය. 3. C E K ය. 4. B F J ය. 5. D G I ය. (.....)

26. ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
   1. A H K ය. 2. B H J ය. 3. D E G ය. 4. I J L ය. 5. D F H ය. (.....)

27. ග්‍රීක කොමඩි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
   1. A F K ය. 2. C J L ය. 3. B G K ය. 4. D F L ය. 5. H J L ය. (.....)

28. මධ්‍යකාලීන නාට්‍ය අන්තර්ගතය හා සම්බන්ධ වන්නේ,
   1. A G I ය. 2. B G K ය. 3. G K L ය. 4. F K L ය. 5. D E J ය. (.....)

29. ග්‍රීක ශෝකාත්ම නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ග්‍රීක ශෝකාත්මයක ආකූලීකරණය යනු සිදුවීම් පැහැදිලි වීමයි.
   2. ග්‍රීක ශෝකාත්මයක ඛේදනීය වීරයා දුර්භාග්‍යයේ සිට සෞභාග්‍ය කරා ගමන් ගනී.
   3. මූලාශ්‍රය කොටගන්නා පුරා කථාව ඒ අයුරින්ම ඉදිරිපත් කෙරේ.
   4. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය සම්පාදනය වනවිට ශ්‍රේෂ්ඨතම ග්‍රීක ශෝකාත්ම නාට්‍ය රචනා වී අවසානය.
   5. පෞර දියෝනිසියා උත්සවයට ඉදිරිපත් කරන ලද්දේ ශෝකාත්මක නාටක පමණි. (.....)

30. ශෝකාත්ම නාට්‍යයක කතා වස්තුව ප්‍රධාන වශයෙන් දෙආකාර බව ඇරිස්ටෝටල් පවසා ඇත. එම ආකාර දෙක වන්නේ,
   1. ප්‍රත්‍යක්ෂය සහ ප්‍රේක්ෂාවයි.
   2. ප්‍රේක්ෂාව සහ සංගීතයි.
   3. සරල සහ සංකීර්ණයි.
   4. අවශ්‍යතාවය හා සම්භාව්‍යතාවයයි.
   5. චින්තනය සහ ස්මරණ ශක්තියයි. (.....)

31. නාට්‍ය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළ අපරදිග විද්වතුන් දෙදෙනෙක් වන්නේ,
   1. ධනංජය සහ ඇරිස්ටෝටල්ය.
   2. ඇලඩයිස් නිකොල් සහ බර්නාඩ් ෂෝය.
   3. භරතමුනි සහ බර්නාඩ් ෂෝය.
   4. ධනංජය සහ භරතමුනිය.
   5. ඇරිස්ටෝටල් සහ අභිනවගුප්තය. (.....)

32. නාට්‍ය විචාරය සම්බන්ධ ලොව පැරණිතම කෘතිය ලෙස සැලකෙන්නේ,
   1. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයයි.
   2. ලියෝ තෝලිස්තෝයිගේ කලාව යනු කුමක්ද යන ග්‍රන්ථයයි.
   3. හොරස්ගේ ආස් පොයටිකාය.
   4. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයයි.
   5. ඇරිස්ටොෆානීස්ගේ සාමය කෘතියයි. (.....)

- **පහත සඳහන් මාතෘකා ඇසුරින් අංක 33 සිට 36 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | ඇජැක්ස් | B | සිටුවරු | C | යදින්නෝ | D | ද ට්‍රොජන් වුමන් |
| E | ප්ලුටස් | F | ඇල්කෙස්ටිස් | G | ඉලෙක්ට්‍රා | H | ඇගමෙම්නොන් |
| I | යුම්නයිඩීස් | J | ෆිලොක්ටටීස් | K | මීඩියා | L | ජන සබයට ගිය ස්ත්‍රීහු |

33. ඊස්කිලස්ගේ නාට්‍ය ගොනුව වන්නේ,
1. A G K ය. 2. C H I ය. 3. B K L ය. 4. D F K ය. 5. E G J ය. (.....)

34. සොෆොක්ලීස්ගේ නාට්‍ය ගොනුව වන්නේ,
1. A G J ය. 2. B C K ය. 3. D G H ය. 4. C H J ය. 5. H I J ය. (.....)

35. යුරිපිඩීස්ගේ නාට්‍ය ගොනුව වන්නේ,
1. A G I ය. 2. B E K ය. 3. D F K ය. 4. F I J ය. 5. H J K ය. (.....)

36. ඇරිස්ටොෆානීස්ගේ නාට්‍ය ගොනුව වන්නේ,
1. A G H ය. 2. B E L ය. 3. D C K ය. 4. E F H ය. 5. F J L ය. (.....)

37. ආනුෂංගික අංගයක් නොවන්නේ මින් කුමක් ද ?
1. අංග රචනය 2. රංගාලෝකය 3. සංගීතය
4. රංග රචනය 5. වේදිකා පාලනය (.....)

38. අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත මත වේදිකා නාට්‍යයකට මුදල් වියදම් කරන්නා හඳුන්වනු ලබන්නේ,
1. නිෂ්පාදක ලෙසය. 2. අර්ථපති ලෙසය.
3. සොඳුරු ආඥා දායකයා ලෙසය. 4. රංග රචකයා ලෙසය.
5. සූත්‍රධර ලෙසය. (.....)

39. මධ්‍යකාලීන යුගයට අයත් වැරදි ප්‍රකාශය තෝරන්න.
1. දෙව්මැදුරුවල වතාවත් වලදී ලතින් භාෂාව භාවිතා වීය.
2. ක්‍රි.ව. 3 සිට 10 තෙක් යුරෝපය තුළ විධිමත් නාට්‍ය කලාවක් නොමැති අඳුරු යුගයක් ඇතිවීය.
3. දෙව්මැදුරේ මැද සහ දෙපස කොරිඩෝරයද නාට්‍ය රඟ දැක්වීමට යොදාගෙන ඇත.
4. ශ්‍රේණි නාටක රඟ දක්වා ඇත්තේ පූජකවරු පමණි.
5. චක්‍ර නාටක රඟ දැක්වීම වෙළඳ ශ්‍රේණිවල විවිධ වෘත්තිකයින්ට පැවරිණි. (.....)

40. ජන වන්දනා නාටකවල වේදිකා රටාවලට අයත් නොවන්නේ මින් කුමක් ද ?
1. මන්දිර වේදිකා 2. ජංගම රථ වේදිකා 3. ප්‍රොසීනියම් වේදිකා
4. බහු වේදිකා 5. බූත් වේදිකා (.....)

# නාට්‍ය හා රංගකලාව
## පළමු වාර පරීක්ෂණය
## 12 ශ්‍රේණිය - II පත්‍රය
### II කොටස

---

- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

01. (i) ප්‍රාසංගික කලාවේ නිර්ණායක හඳුන්වන්න. (ල. 4)
    (ii) සිනමාව හා ප්‍රාසංගික කලාව අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 5)
    (iii) ප්‍රාසංගික කලා අතර නාට්‍යයට හිමිවන ස්ථානය පැහැදිලි කරන්න. (ල. 6)

02. (i) ඇරිස්ටෝටල් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.
    (ii) ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයට අනුව ශෝකාත්පාදයක අන්තර්ගත මූලිකාංග නම් කරන්න.
    (iii) ඉන් ඇරිස්ටෝටල් ප්‍රධාන ලෙස සලකන අංගය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

03. (i) ග්‍රීක නාට්‍යය රංග භූමිය ඇඳ නම් කරන්න.
    (ii) එහි අන්තර්ගත කොටස් දෙකක භාවිතය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.
    (iii) ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයක රංග ශෛලීය ඔබ දන්නා ග්‍රීක නාට්‍යයක් නිදසුන් කරගනිමින් විස්තර කරන්න.

### B - කොටස

04. (i) යුරෝපයේ ජන වන්දනා නාට්‍ය බිහිවීමට බලපෑ ආගමික පසුබිම පැහැදිලි කරන්න.
    (ii) ජන වන්දනා නාට්‍ය ප්‍රභේද නම් කොට ඉන් එකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
    (iii) ජන වන්දනා නාට්‍යවල රංග ශෛලිය පැහැදිලි කරන්න.

05. (i) නාට්‍යමය ලක්ෂණ වර්ධනය වූ ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් ග්‍රීක නාට්‍යයෙහි ප්‍රභවය විස්තර කරන්න.
    (ii) ග්‍රීක ට්‍රැජඩියක හා කොමඩියක විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.
    (iii) ග්‍රීක ශෝකාත්මක නාට්‍ය රචකයකුගේ සේවය ඇගැයීමට ලක් කරන්න.

06. (i) ඊඩිපස් රජ නාට්‍යයෙහි ඇතුලත් චරිත හතරක් නම් කරන්න.
    (ii) ඊඩිපස් රජ නාට්‍යයට පසුබිම් වූ පුරාවෘත්තය පැහැදිලි කරන්න.
    (iii) ඊඩිපස් නාට්‍ය පෙළ ඇසුරු කොටගෙන ගායක වෘන්දයේ කාර්යභාරය පැහැදිලි කරන්න.

# පළමු වාර පරීක්ෂණය 2019 - නාට්‍ය හා රංගකලාව

## 12 ශ්‍රේණිය - I පත්‍රය

### I කොටස

### පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 01 - 4 | 11 - ✗ | 21 - 4 | 31 - 3 |
| 02 - 2 | 12 - නළුවා සහ ප්‍රේක්ෂකයා | 22 - 5 | 32 - 5 |
| 03 - 5 | 13 - ප්‍රේක්ෂාව | 23 - 1 | 33 - 1 |
| 04 - 1 | 14 - රංග රචනය | 24 - 4 | 34 - 4 |
| 05 - 5 | 15 - ඇලඩයිස් නිකොල් | 25 - 3 | 35 - 5 |
| 06 - 3 | 16 - බර්නාඩ් ෂෝ | 26 - 4 | 36 - 5 |
| 07 - ✓ | 17 - 1 | 27 - 5 | 37 - 1 |
| 08 - ✓ | 18 - 1 | 28 - 2 | 38 - 2 |
| 09 - ✗ | 19 - 1 | 29 - 4 | 39 - 4 |
| 10 - ✓ | 20 - 4 | 30 - 1 | 40 - 5 |

### II කොටස

01. (i) නෘත්ත යනු, ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූලව කෙරෙන අංග චලනයයි. අර්ථයක් ප්‍රකාශ නොවන අතර රිද්මයක් දක්නට ලැබේ. නෘත්‍ය යනු අර්ථ ප්‍රකාශනයක් සහ භාව ප්‍රකාශනයක් සහිත නර්තනයයි. (ල. 4)
    (ii) සංගීත ප්‍රසංග, නර්තන ප්‍රසංග, විවිධ ප්‍රසංග යනාදියෙහි නෘත්ත, නෘත්‍ය දක්නට ලැබේ. පහතරට නර්තනයේ එන ශුද්ධ මාත්‍රා, තෙල්මේ නැටුම, පන්දම් පද, උඩරට වෙස් නැටුම, ලී කෙළි ආදිය, නෘත්ත ගණයට වැටේ. භරත නාට්‍යයේ එන වර්ණම්, අලාරිප්පු, පදම් ආදිය නෘත්‍ය ගණයට වැටේ. (ල. 5)
    (iii) සතර අභිනයම භාවිතා වේ. නාටෝචිත අවස්ථා මතුකළ හැකිය. චරිත වල මනෝභාව, මනෝගති ඉස්මතු කළ හැකිය. ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 6)

02. (i) ඉදිරිපත් කළ විද්වතුන් සමඟ නිර්වචන 2ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 4)
    (ii) සජීවී බව / ඍජු ප්‍රේක්ෂක සහභාගිත්වය/සාමූහික බව/ගැටුම/ශෛලියක් තිබීම/සාමූහික රසවින්දනය ආදී වශයෙන්. (ල. 5)
    (iii) සංගීතය, නර්තනය, සාහිත්‍ය කලාව, චිත්‍ර කලාව වැනි කලාවන් නාට්‍ය තුළ අන්තර්ගත ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 6)

03. (i) භාරතය/ඉන්දියාව - භරත මුණිවරයා (ල. 4)
    (ii) ''භරතමුණි පෙන්වා දෙන ආකාරයට චරිතයන්ගේ ස්වභාවික ගති පැවතුම් පදනම් කොටගෙන සම්පාදිතව ඇත්නම්. එහි ලෞකික ක්‍රියා ඇතුලත්ව පවතින්නේ නම්, ස්වභාවික අභිනය භාවිතා වන්නේනම්, එය ලෝක ධර්මී සෙලයි. ඒ අනුව සැබෑ ලෝකයේ සිදුවන පරිද්දෙන්ම නාට්‍යයක ක්‍රියා හා සංවාද යථා ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම ලෝක ධර්මී වේ. (ල. 5)
    (iii) නාට්‍ය ධර්මී හා ලෝකධර්මී ලක්ෂණ වල සංකලනයක් දැකිය හැකි බව පිළිතුරෙන් පැහැදිලි විය යුතුය.
    **ලෝකධර්මී නාට්‍යයක ඇති නාට්‍යධර්මී ලක්ෂණ :**
    * මිනිස් ක්‍රියාකාරකම් අනුරූපණය හා අභිරූපණය මගින් ඉදිරිපත් කිරීම.
    * ආත්මභාෂණ/ඒකලභාෂණ යොදාගැනීම.
    * ප්‍රේක්ෂාව මැවීමට ස්වභාවික නොවන විවිධ රංග උපක්‍රම අනුගමනය කිරීම.
    * නාට්‍ය උපකරණ හා පසුතල සංකේතාත්මකව හෝ අතිශයෝක්තියකින් යොදා ගැනීම.
    **නාට්‍යධර්මී නාට්‍යවල ඇති ලෝකධර්මී ලක්ෂණ :**
    * ගද්‍ය සංවාද ස්වභාවික අයුරින් ඉදිරිපත් කිරීම.
    * ආංගික අභිනයෙන් ස්වභාවික චලන අනුගමනය කිරීම.
    * නාට්‍ය උපකරණ භාවිතා කිරීම. (ල. 6)

## B කොටස

04. (i) නාට්‍ය පිටපතෙහි සඳහන් දෑ ප්‍රේක්ෂකයාඉදිරියට ගෙන ඒම සඳහා යොදාගැනීමේ උපක්‍රමය අභිනයයි. නාට්‍ය පෙළ රංගයක් ලෙස ප්‍රේක්ෂකයා වෙත ගෙනයාමේදී ඒ සඳහා චතුර්විධ අභිනය යොදා ගනී. ආංගික, වාචික, සාත්වික, ආහාර්ය යනුවෙන් හඳුන්වා දී ඇත්නම් ලකුණු දෙන්න. (ල. 4)

(ii) අභිනය අයත්වන්නේ රූපණයට බව සහේතුකව විග්‍රහකර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 5)

(iii) රංගනය සඳහා වේදිකාවට බැහැරින් ගෙන යනුලබන සියලු දෑ ආහාර්යය අභිනයට අයත් වේ. අංගරචනය, වේෂභූෂණය, සංගීතය, ආලෝකය, පසුතල නාට්‍ය උපකරණ උදාහරණ සහිතව ලියා ඇත්නම් (ල. 6)

05. (i) නළුවා, ප්‍රේක්ෂකයා, රංගභූමිය, අභිනය, නාට්‍යපෙළ, වේෂභූෂණය, අංග රචනය, අධ්‍යක්ෂණය, රංග වින්‍යාසය, ප්‍රේක්ෂාව (4ක් නම්) (ල. 4)

(ii) ඉහත මූලිකාංග දෙකක්ගැන කෙටි විස්තරයක් කර ඇත්නම් (ල. 5)

(iii) නාට්‍ය අධ්‍යක්ෂණයට එකී අංගවල දායකත්වය කෙසේදැයි ප්‍රමාණවත්ව විස්තර කොට ඇත්නම් ලකුණු දෙන්න. (ල. 6)

06. (i) ආධුනික රංගන ශිල්පියෙක් තම රංගන කුසලතා දියුණුකර ගැනීම සඳහා මූලිකව සිදුකරනු ලබන අභ්‍යාස රංග අභ්‍යාස ලෙසත්, සාමූහිකත්වය, අන්‍යමත ගරු කිරීම ආදිය වැඩිදියුණු කිරීම සඳහා කරනු ලබන ක්‍රීඩා රංග ක්‍රීඩා ලෙසත් හඳුන්වයි. (ල. 4)

(ii) රංග ක්‍රීඩා : අත්තල ක්‍රීඩාව, මකර වලිගය කැඩීම, මීයෝ පූසෝ, පළතුරු ක්‍රීඩාව, රාක්ෂයෙක් ගමට ඇවිත්, ගස් දෙකේ යුද්ධය වැනි ක්‍රීඩා.
රංග අභ්‍යාස : චලන අභ්‍යාස, ස්වසන අභ්‍යාස කටහඬ අභ්‍යාස, චිත්ත ඒකාග්‍රතා අභ්‍යාස, ශිථිලකරණ අභ්‍යාස, සංවේදන අභ්‍යාස. (ල. 5)

(iii) සබකෝලය දුරුවීම. වින්දනය ලැබීම. ජය පරාජය විඳදරා ගැනීම. සංයමය දියුණුවීම.
ඉවසීම මතක ශක්තිය වර්ධනය ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව.
සාමූහිකත්වය වර්ධනය. දැරීමේ හැකියාව. සහයෝගීතාවය
අන් අයට ගරු කිරීම. අන්මත ඉවසීම. කරුණු 6ට (ල. 6)

## පළමු වාර පරීක්ෂණය 2019 - නාට්‍ය හා රංගකලාව

## II පත්‍රය

## I කොටස

## පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 01 - 4 | 11 - 1 | 21 - 3 | 31 - 2 |
| 02 - 2 | 12 - 1 | 22 - 1 | 32 - 4 |
| 03 - 4 | 13 - 5 | 23 - 4 | 33 - 2 |
| 04 - 3 | 14 - 5 | 24 - 3 | 34 - 1 |
| 05 - 1 | 15 - 3 | 25 - 3 | 35 - 3 |
| 06 - 3 | 16 - 4 | 26 - 2 | 36 - 2 |
| 07 - 2 | 17 - 2 | 27 - 4 | 37 - 5 |
| 08 - 5 | 18 - 4 | 28 - 1 | 38 - 2 |
| 09 - 4 | 19 - 4 | 29 - 4 | 39 - 4 |
| 10 - 3 | 20 - 3 | 30 - 3 | 40 - 3 |

## II කොටස

## A - කොටස

01. (i) අභිනය භාවිතය, සජීව රංගනය, සජීවි ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කිරීම, රංග භූමියක් භාවිතා කිරීම, මනා ප්‍රසාංගිකත්වයකින් යුක්ත වීම. ගැඹුරු ජීවන අත්දැකීමක් මෙන්ම විනෝදාස්වාදයක් රසයක්, ලබාදීම. (ල. 4)

(ii) සිනමාව හා ප්‍රාසාංගික කලාව අතර ඇති වෙනස සජීවි නොවන බව, කැමරා ඇසින් දකින දේ ප්‍රේක්ෂකයාට ප්‍රක්ෂේපණය කිරීම. තිරයක් මත දර්ශනයවීම ආදිය ලියා ඇත්නම්. (ල. 5)


(iii) * ගැටුම් අවස්ථා තිබීම. * නාට්‍යයකදී සතර අභිනයම භාවිතා කරයි.
* විවිධ ශෛලීන්ට හා රංග රීතීන්ට අනුව නාට්‍ය නිෂ්පාදනය කළ හැකිය.
* චරිතවල සියුම් මනෝගති, මනෝභාව ඉස්මතු කළ හැකිය.
* අත්දැකීමක්, පුරාවෘත්තයක්, ඓතිහාසික සිදුවීමක් නාට්‍යෝචිත අවස්ථා මතුවන පරිදි නිර්මාණය කළ හැකිය.
* පැය කීපයක් වුව අඛණ්ඩව රඟ දැක්වීම. (ල. 6)

02. (i) ඇරිස්ටෝටල් ක්‍රි.පූ. 384 දී ග්‍රීසියේ මැසිඩෝනියාවට නුදුරින් පිහිටි ස්නගිර නම් කුඩා නගරයේ උපත ලැබීය. ක්‍රි.පූ. 367 දී ප්ලේටෝගේ අධ්‍යාපනයාතනයට බැඳී ශිෂ්‍යයෙකු ලෙස අවු. 20 ගණනක් සිටි ඔහුගේ 40 - 60 විය දක්වා කාලයේ ''කාව්‍ය ශාස්ත්‍රය'' ඇතුළු ඔහුගේ ප්‍රධාන කෘති සම්පාදනය කළ අතර ක්‍රි.පූ. 322 දී ඊජියන් මුහුදේ යුබෝයේ නම් දූපතේ අවසන් හුස්ම හෙළීය. (ල. 4)

(ii) කතා වස්තුව, චරිත, වාග් විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය (ල. 5)

(iii) ප්‍රධාන අංග ලෙස ''කතා වස්තුව'' සලකන අතර කතා වස්තුව යනු කතාවේ මුල, මැද, අග සිද්ධි ගැලපීමේ පිළිවෙලය. ට්‍රැජික් වීරයා සෞභාග්‍යයේ සිට දුර්භාග්‍යය කරා ගමන් ගන්නා ආකාරයයි. සරල හා සංකීර්ණ වශයෙන් කොටස් 2කි. ක්‍රියාවේ ඒකාග්‍රතාවය, ආකූලීකරණය, අනාවරණය, ප්‍රත්‍යවර්ථනය සහ ප්‍රත්‍යභිඥානය යන්න පිළිබඳ ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
(ල. 6)

03. (i)




(ii) රංග භූමියේ කොටස් දෙකක් පිළිබඳව පැහැදිලිකර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ල. 5)

(iii) * වෙස් මුහුණු භාවිතය. * පිරිමින් පමණක් රඟපෑම.
* පශ්චාත් දෘෂ්ටි කථන ක්‍රමය අනුගමනය කිරීම.
* ප්‍රධාන චරිත සඳහා නළුවන් 2ක් හෝ 3ක් පමණක් යොදා ගැනීම.
* ගායන වෘන්දය රංග කාර්ය සඳහා යොදා ගැනීම.
* මරණය වැනි භීෂණ ක්‍රියා වේදිකාවේ රඟ නොදැක්වීම.
* මකුට හා පාවහන් මගින් නළුවාගේ ශරීරය විශාල කොට දැක්වීම.
* ස්කිනි ගොඩනැගිල්ල පසුතල ලෙස සැලකීම.
* එක්කුක් ලීමා හා මකීනා (දොඹකර) ආදිය භාවිතය.

## B කොටස

04. (i) * ක්‍රි.ව. 3-10 අතර කාලය තුළ අඳුරු යුගයක් පැවතීම.
* කතෝලික දෙව් මැදුරු තුළ ලතින් භාෂාවෙන් වතාවත් පැවැත්වීම.
* ලතින් භාෂාව සාමාන්‍ය ජනයාට නොතේරීම නිසා මිනිසුන් පල්ලියෙන් දුරස් වීම.
* මිනිසුන් පල්ලියට ගෙන්වා ගැනීමේ අරමුණින් බයිබලයේ කතා පුවත් නාට්‍යානුසාරීව පැවැත්වීම.
* නාට්‍ය මාධ්‍ය කොටගෙන ආගමික පණිවිඩ ලබාදීම. කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(ල. 4)

(ii) මිස්ටර්, මිරකල්, මොරලිටි යනුවෙන් නම් කොට ඉන් එකක් පිළිබඳ විස්තර කොට ඇත්නම් (ල. 5)

(iii) රංග ශෛලිය පිළිබඳ ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 6)

05. (i) ග්‍රීක වැසියන් දියෝනිසස් දෙවියන්ට කරනු ලැබූ අභිචාර ඇසුරින් ප්‍රභවය ලැබීය. මීදි යුෂ පානය කර මත්වී දෙවියන් ආවේෂවී ඇතැයි සිතා ලිංග සංකේත අතින් ගෙන අසභ්‍ය විහිළු තහළු වලින් දෙවියන් වෙත පූජෝපහාර පවත්වා ඇත. වෘන්ද ගායනා ඉදිරිපත් කළ අතර ඒවා ඩිතුරම්බොස් ලෙස හඳුන්වා ඇත. මේවා උත්තර, ප්‍රතිඋත්තර ක්‍රමයෙන් සංවාදාත්මක ස්වරූපය දක්වා වර්ධනය වූ අතර තෙස්පීස් පළමු නළුවා විය.

(ii) ග්‍රීක කොමඩි, ට්‍රැජඩි ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 5)

(iii) ග්‍රීක ට්‍රැජඩි නාට්‍යකරුවෙකු පිළිබඳ ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ඊස්කිලස්, සොෆොක්ලිස්, යුරිපිඩිස්)(ල. 6)

06. (i) ඊඩිපස් රජ, ජොකොස්ටා බිසව, ක්‍රේයොන්, ටෙරේසියාස් ගොපල්ලා, පණිවුඩකරු ආදී චරිත 4ක් නම් කිරීමට.
(ල. 4)

(ii) ඊඩිපස් රජ නාට්‍යයට පසුබිම් වූ පුරා වෘත්තය පැහැදිලි කිරීමට. (ල. 5)

(iii) ඊඩිපස් නාට්‍යයේ ඇසුරින් ගායක වෘන්දයේ කාර්යභාරය විස්තර කිරීමට. (ල. 6)
* චරිතයක් ලෙස ක්‍රියා කිරීම. * චරිතවලට අවවාද ලබාදීම.
* අතීත සිදුවීම් ගෙනහැර දැක්වීම. * චරිත හඳුන්වා දීම.
* චිත්ත අභ්‍යන්තරය හෙළිදරව් කිරීම. * භීෂණ ක්‍රියා හෙළිදරව් කිරීම.
* වේදිකාවේ පෙන්විය නොහැකි කොටස් ගායක කණ්ඩායම මගින් ඉදිරිපත් කිරීම.